# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
## உள்நாட்டு இறைவரித் திணைக்களம்
## DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு -2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax - 011-2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone - 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 20135411

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


**SEC 2016/05** **2016 අප්‍රේල් 18**

**විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත්ව අයිතමයන් ආනයනකරුවන්ගේ පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තු (ESC) කලින් පැනවීම**

2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය මඟින් ලබා දෙන ලද උපදෙස් පරිදි, ආර්ථික සේවා ගාස්තු පනතට කරනු ලබන සංශෝධනයට යටත්ව, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට (SCL) යටත් අයිතමයන් ආනයනකරුවන්ගේ පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තු කලින් අය කිරීම 2016.04.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දෙනු ලැබේ.

විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත් භාණ්ඩ ආනයනය කරන්නන් විසින් සෑම ආනයනයකදීම, ශ්‍රී ලංකා රේගුව වෙතින් එම භාණ්ඩ නිෂ්කාශනය කිරීමට පෙරාතුව, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කරන ලද මිල රක්ෂණ ගැල් කුලී අගය (CIF අගය) මත සියයට 0.5 ක අනුප්‍රමාණයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇති ගෙවීම් පත්‍රිකා භාවිතා කරමින් මුදලින් හෝ බැංකු අණකරයක් මඟින් ආර්ථික සේවා ගාස්තු බැංකු වෙත කලින් ගෙවිය යුතුය.

ගෙවන ලද ගෙවීම් පත්‍රිකාව බදු සේවා අංශයේ කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම මඟින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු "ආර්ථික සේවා ගාස්තු නිෂ්කාශන සහතිකය" ලබා ගැනීමට ආනයනකරුට හැකි වේ.

ඉහත සඳහන් කරන ලද කරුණු වලට අතිරේක වශයෙන්, නිෂ්කාශන සහතිකය ලබා ගැනීම පිණිස පහත සඳහන් විස්තර ඉදිරිපත් කළ යුතුය.

1. ආනයනකරුගේ නම
2. ලිපිනය
3. බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය
4. ආදායම් බදු ලිපිගොනු අංකය (TIN අංකයෙන් වෙනස් නම්)
5. රේගු තක්සේරු අංකය
6. ආනයනය කරන ලද භාණ්ඩ සහ ගෙවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු
7. ආනයනය කිරීමේ දිනය
8. රේගු තක්සේරුව අනුව CIF අගය
9. ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු වටිනාකම සහ දිනය

කල්‍යාණි දහනායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

කල්‍යාණි දහනායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්